# අය වැය වාර්තාව

***ගරු සභාපති තුමණි, ගරු අමාත්‍යවරුණි,***
***ගරු පළාත් සභා මන්ත්‍රීවරුණි,***

නැගෙනහිර පළාත් සභා මහ ඇමැතිවරයෙකු වශයෙන් අප පළාත් සභා ඉතිහාසයේ ප්‍රථම වරට මෙම ගෞරවාන්විත සභාවේදී අය වැය වාර්තාවක් ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලැබීම ගැන මා අතිශයින් සතුටට පත්වෙමි.

නැගෙනහිර පළාත ප්‍රචණ්ඩත්වයෙන් මුදවාගෙන, ප්‍රජාතන්ත්‍රවාදී මැතිවරණයක් පවත්වා අප පළාත් සභාවේ පාලනය භාර ගත්තෙමු. පසුගිය දශක දෙකකට වැඩි කාලයක් තිස්සේ පැවැති දරුණු යුද්ධය, තිස්සේ දීර්ඝ කාලයක් තිස්සේ දේශපාලන නායකත්වයක් නොමැතිව තිබූ තත්ත්වය, ස්වාභාව ධර්මයාගේ බලපෑම වැනි විවිධ හේතූන් මත පළාත් සභාව අධ්‍යාපනය, සෞඛ්‍යය, යටිතල පහසුකම් වැනි ක්ෂේත්‍ර තුළින් අප විශාල පසු බැස්මකට ලක්වී සිටිමු.

දිළිඳු බව හා නොසන්සුන් වාතාවරණයක් මත ජීවත්වන සමාජයේ දේශපාලන වගකීම් භාරගත් අවස්ථාවේ දී අපහට විශාල අභියෝගයකට මුහුණ දීමට සිදුවිය. අති විශාල බලාපොරොත්තුවක් ඇති කරගෙන සිටින ප්‍රජාවගේ අවශ්‍යතා සපුරා දීමට අවශ්‍ය කටයුතු කිරීමේ දී විවිධ අපහසුතා සහ බාධක රැසකට, මුහුණ දීමට සිදුව ඇති නමුත් ප්‍රායෝගිකව යහපත් අන්දමින් ඉතා කඩිනමින් නැගෙනහිර පළාත සංවර්ධනය කිරීමේ සම්පූර්ණ විශ්වාසයක් මත මෙම අය වැය වාර්තාව ඉදිරිපත් කෙරේ.

අධ්‍යාපනය, සෞඛ්‍ය ශුභ සාධනය, යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, වෘත්තීය මාර්ග සලසා දීම මෙහිදී වැදගත් කොට සලකනු ලැබේ. මෙම වාර්තාව සකස් කොට තිබෙන්නේ. ඉදිරි වර්ෂයේදී මෙම අය වැය වාර්තාව මධ්‍යම ආණ්ඩුව, ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව, ආධාර දෙන අනෙකුත් රටවල්වල ආධාර සහ මූල්‍යාධාර මත අපගේ ස්වයං ආදායම් ප්‍රධාන වශයෙන් පදනම් කරගෙනය.

මේ පිළිබඳ සම්පූර්ණ විස්තර මේ සමඟ අමුණා ඇත. අප පළාතේ කඩිනම් සංවර්ධනය, පීඩනයට පත්වූ ජනතාවට පුනරුත්ථාපනය ලබාදීම ආදිය මුල් කොට ගෙන සකස් කර ඇති මෙම අය වැය වාර්තාව සභාව අනුමත කරනු ඇතැයි යන පූර්ණ විශ්වාසයක් මත මෙය ඉදිරිපත් කරමි.

***1. ජාතික ඒකාබද්ධතා.***

කිසියම් සංවර්ධනයක් සඳහා ජාතික ඒකාබද්ධතාවයක් අවශ්‍ය වේ. ඒ සඳහා වූ කාර්යාලයක් මඩකලපුවේ ආරම්භ කොට වැඩසටහන් බොහොමයක් මේ වනවිටත් දියත් කොට ඇත. මෙම වැඩසටහන් ත්‍රිකුණාමලය අම්පාර දිස්ත්‍රික්කයට ද ව්‍යාප්ත කිරීමට නියමිතය. එම කාර්යාලයේ වැඩසටහන් ඉතා සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතී.

2. ***නැවත පදිංචි කිරීම.***

මඩකලපුව සහ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ නැවත පදිංචි කිරීම් දැනට සිදුවෙමින් පවතී. නමුත් දහස් ගණන් ජනතාව සුභසාධන මධ්‍යස්ථානවල සහ තම ඥාතීන් හිත මිතුරන්ගේ නිවෙස්වල තාවකාලිකව පදිංචි වී සිටී. අවුරුදු 20 කට අධික කාලයක් තම මුල් පදිංචි ස්ථාන වලට යා නොහැකි තත්ත්වයෙන් පසුවෙන ජනතාව ද මේ අතර ඇත. මේ සියළු දෙනාම 2009 වර්ෂයේ නැවත පදිංචි කිරීම අපගේ යුතුකමක් වනු ඇත. එහෙයින් ඉහත කරුණු සැලකිල්ලට ගෙන, නැගෙනහිර පළාතේ නැවත පදිංචි කිරීමේ ප්‍රඥප්තියක් අප විසින් සකස් කර ඇත.

3. *අධ්‍යාපනය*

දැනට නැගෙනහිර පළාතේ පළාත් රාජ්‍ය පාසල් 985 ක් ක්‍රියාත්මක වෙමින් පවතී. ඇතැම් ප්‍රදේශවල ජනතාව නැවත පදිංචි කර නොමැති නිසා පාසල් 33 ක් ක්‍රියාත්මක නොවී පවතී. ජාතික පාසල් 27 ක් ද මෙම පළාතේ ක්‍රියාත්මක වේ. පළාත් පාසල් සිසුන් සංඛ්‍යාව 382,088 කි. මේ අයගෙන් දෙමළ මාධ්‍ය සිසුන් 305,419 ක් වන අතර, සිංහල මාධ්‍ය සිසුන් සංඛ්‍යාව 76,669 කි. පවත්නා වර්ෂයේ දෙමළ මාධ්‍ය ගුරුවරු 1107 දෙනෙක ද සිංහල මාධ්‍ය ගුරුවරු 336 දෙනෙකු ද අළුතින් බඳවාගෙන ඇත.

ඉදිරි 2009 වර්ෂයේ මුහුණ දීමට සිදුවන ප්‍රධාන මූලික ප්‍රශ්නය වනුයේ විද්‍යා විෂයය ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගෙන්වීම පිණිස ඉංග්‍රීසි ගුරුවරු 773 ක් සහ විද්‍යා ගුරුවරු 231 දෙනෙකු බඳවා ගැනීමයි. ඉංග්‍රීසි භාෂාව ඉගෙන්වීමට කැමැති වැඩසටහන් සහකාර නිලධාරිවරුන් (උපාධිධාරීන්) සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරාගෙන, ඔවුන්ට ඉංග්‍රීසි භාෂාව ඉගෙන්විය හැකි උපාධිධාරී ගුරුවරු ලෙස පුහුණුවක් ලබාදීම තුළින් ඉංග්‍රීසි ගුරු හිඟය පියවීමට හැකිවනු ඇත.

එසේම, ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ පවතින පුරප්පාඩු වසර ගණනාවකින් සම්පූර්ණ කිරීමට පියවරක් නොගෙන තිබීම තවත් ප්‍රශ්නයකි. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන් 238 දෙනෙකු සිටිය යුතු පළාතක දැනට සිටිනුයේ 70 දෙනෙකු පමණි. 1 වැනි පන්තියේ නිලධාරීන් 16 දෙනෙකු සිටිය යුතු පළාතක දැනට කිසිවෙකු නොමැත. 11 වැනි පන්තියේ නිලධාරීන් 67 දෙනෙකු සිටිය යුතු පළාතක දැනට සිටිනුයේ 22 දෙනෙකු පමණි. 111 වැනි පන්තියේ නිලධාරීන් 155 දෙනෙකු සිටිය යුතු පළාතක දැනට සිටිනුයේ 48 දෙනෙකු පමණි. මේ සම්බන්ධයෙන් මධ්‍යම රජය වහාම පියවර නොගන්නේ නම්, ඒ සඳහා ගත හැකි එකම ක්‍රියාමාර්ගය පළාත් අධ්‍යාපන පරිපාලන සේවයක් ස්ථාපිත කිරීමයි.

4 *සෞඛ්‍ය සේවාව.*

නැගෙනහිර පළාතේ සෞඛ්‍ය සේවා ආයතන 155 ක් ඇත. තවද අප භාරයේ තිබූ රෝහල් 05 ක් මධ්‍යම අමාත්‍යාංශය විසින් පවරාගෙන ඇත. සෑම රෝහලකම ඇඳන් සංඛ්‍යාව සාමාන්‍යයෙන් 4000 ක් පමණ වනු ඇත.

2008 වර්ෂයේ වාලෙයිචේනයි ප්‍රදේශයේ බාහිර රෝගී අංශයක් ද, මන්ඩූර් ග්‍රාමීය රෝහලේ ඇඳන් 24 ක් සහිත වාට්ටුවක් ද, ත්‍රිකුණාමලය මහ රෝහලේ ඇස් වාට්ටුවක් ද මධ්‍යම කඳවුරේ ඇඳන් 48 ක් සහිත වාට්ටුවක් ද, දෙපාර්තමේන්තු මගින් ඉටු කරන ලද විශාල සේවාවන් වනු ඇත. එසේම ඇතැම් රෝහල් වලට වෛද්‍ය උපකරණ ද සපයා ඇත.

ඉදිරි 2009 වර්ෂයේ මාවඩිපල්ලියේ බාහිර රෝගී අංශයක් ඉදිකිරීම, අක්කරෙයිපත්තු රෝහලේ බාහිර රෝගී අංශයක් ඉදිකිරීම, කලවාංජිකුඩි මූලික රෝහලේ මාතෘ නිවාසයක් ඉදිකිරීම, තොට්ටම රෝහගේ දන්ත වෛද්‍ය සේවා අංශයක් සහ වෛද්‍ය නිළ නිවාස ඉදිකිරීම අපගේ ඉදිරි වැඩ පිළිවෙල වේ.

5. දේශිය වෛද්‍ය කටයුතු දෙපාර්තමේන්තුව යටතේ පළාත් ආයුර්වේද වෛද්‍ය ආරෝග්‍ය ශාලාවක්ද , මධ්‍යම ආයුර්වේද බෙහෙත් ශාලා 38ක් ද දැනට ක්‍රියාත්මකව ඇත. 2008 වර්ෂයේ මධ්‍යම ආයුර්වේද බෙහෙත් ශාලා 15 ක් විවෘත කරන ලදි. කප්පල්තුරේ " **පංචකර්ම** " ඒකක 40 ක් විවෘත කරන ලද අතර, ඇඳන් 40 ක් සහිත කාන්තා සහ පිරිමි වාට්ටු විවෘත කර ඇති අතරම එහි බෙහෙත් ශාලාවක් ද විවෘත කර ඇත.

2009 වර්ෂයේ තවත් බෙහෙත් ශාලා කිහිපයක් විවෘත කිරීමට නියමිතව ඇති අතර, අක්කර 18 ක ඖෂද පැළැටි වගා කිරීමට ද පියවර ගෙන ඇත. එසේම අක්කර 10 ක සෞඛ්‍ය නිකේතන ඉදිකිරීමට ද පියවර ගනු ඇත.

6. ***කෘෂිකර්මය හා ගොවිජන සේවා***

2009 වර්ෂයේ පුරන් වූ කුඹුරු අක්කර 30,000 ක් වගා කිරීමට මූලික පියවර ගෙන ඇති අතර, එම වගා කටයුතු වලට දිරි ගැන්වීමක් වශයෙන් බිත්තර වී හෝ සීසෑම් කර දීමට ද පියවර ගෙන ඇත. මීට අමතරව සුපුරුදු පරිදි අනෙකුත් කුඹුරුවල ද ගොවිතැන් කරනු ලැබේ. එසේම අක්කර 20,000 ක බඩ ඉරිගු වගා කිරීමට නියමිතව ඇත.

පවත්නා වර්ෂයේ පළතුරු ගම්මාන 25ක් ද එළවළු ගම්මාන 25 ක්ද උදා කර ඇත. මීළඟ වර්ෂයේ එනම්, 2009 වර්ෂයේ පළතුරු ගම්මාන 15ක් ද එළවළු ගම්මාන 30 ක්ද උදා කරනු ඇත.

2008 වර්ෂයේ දී ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයට පොල් පැළ 2000 ක් ලබාදී ඇත. මීළඟ වර්ෂයේ පැළ 10,000 ක් ලබාදෙනු ඇත. 2008 වර්ෂයේ දී හාල් පිටි කොටන යන්ත්‍ර 100 ක් ලබාදීමට පියවර ගෙන ඇත. ඊළඟ වර්ෂයේ යන්ත්‍ර 120 ක් ලබාදෙනු ඇත.

පළාතේ කෘෂි පර්යේෂණ නිලධාරිවරු 53 දෙනෙකු බඳවා ගෙන ඇති අතර, අක්‍රියාකාරීව තිබූ තරුණ ගොවිජන සේවා සමිති 94 ක් 2008 වර්ෂයේ සිට ක්‍රියාත්මකව පවතී.

7. ***සත්ත්ව පාලනය***

2008 වර්ෂයේ දී මඩකලපුව දිස්ත්‍රික්කයේ යුද්ධමය වාතාවරණය හේතුවෙන් පවුල් 80,000 ට අයත් ගවයන් එම සතුන්ගේ අයිතිකාරයින් වෙත භාරදී ඇත. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ද එවැනි ගවයන් එහි අයිතිකාරයින් වෙත භාරදීමේ කටයුතු දැනටමත් ක්‍රියාත්මක වෙමින් පවතී.

2008 වර්ෂයේ කිරි ගම්මාන 12 ක් ද එළු ගම්මාන 10 ක් ද කිරිවල වටිනාකම වැඩි කිරීමේ ව්‍යාපෘති 12 ක් ද ක්‍රියාත්මකව ඇත. මීළඟ 2009 වර්ෂයේ කිරි ගම්මාන 15 ක් ද එළු ගම්මාන 15 ක් ද කිරිවල වටිනාකම වැඩි කිරීමේ ව්‍යාපෘති 15 ක් ද නිම කිරීමට සැලසුම් කර ඇත.

8. **කුඩා කර්මාන්ත**

මධ්‍යම ආණ්ඩුව භාරයේ නොමැති කුඩා කර්මාන්ත සියල්ලක්ම පළාත් රජයට අයත්වේ. එහෙත් ප්‍රඥප්තියක් නොමැතිව අපහට එම කුඩා කර්මාන්තවල අධීක්ෂණ කටයුතු ක්‍රියාත්මක කළ නොහැක. 2009 වර්ෂයේ මේ සඳහා ප්‍රඥප්තියක් සකස් කොට පළාත් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

***9.*** **ග්‍රාමීය කුඩා කර්මාන්ත**

2009 වර්ෂයේ දී මධ්‍යස්ථාන 52 ක තරුණ තරුණියන් 450 දෙනෙකුට පේෂ කර්මාන්ත පුහුණුව ලබාදෙන ලදී. එසේම, මධ්‍යස්ථාන 80 ක තල්කොළ පුහුණුව හා කොහු කර්මාන්ත පුහුණුව ලබාදෙමින් පවතී.

10. **ග්‍රාමීය සංවර්ධනය**

ග්‍රාමීය සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ කොට්ඨාශ 41ක සෑම වර්ෂයක් පාසාම සිසුන් 400 දෙනෙකු මැහුම් පුහුණුව ලබයි. මෙම මැහුම් පුහුණු කර්මාන්තය 2009 වර්ෂයේ ද ක්‍රියාත්මක වනු ඇත. එසේම සුළු වෙළඳ ව්‍යාපාර, ගව පාලනය, එළු පාලනය, කුකුල් පාලනය යනාදි වශයෙන් ජීවනෝපාය පුහුණු වැඩසටහන් ද ලබාදෙනු ඇත.

11. **කාන්තා කටයුතු.**

කාන්තා කටයුතු අංශයේ ප්‍රධාන අරමුණ වනුයේ, යුද්ධයෙන් පීඩනයට පත්වූ වැන්දඹු කාන්තාවන්ට හා ස්වාමි පුරුෂයින්ගෙන් වෙන්වී සිටින කාන්තාවන්ගේ ජීවනෝපාය නගා සිටුවීමය. මේ සඳහා මෙම කාන්තාවන්ට කුඩා කර්මාන්ත පුහුණුව, පේෂ කර්මාන්තය, කොහු කර්මාන්තය හා සම් භාණ්ඩ නිශ්පාදන කිරීම පිළිබඳ පුහුණුව වැනි පුහුණු වැඩසටහන් රාශියක් දැනටමත් ක්‍රියාත්මකව පවතී.

12. **ධීවර කර්මාන්තය**

මේ දක්වා ධීවර කර්මාන්තය ක්‍රියාත්මක කරනු ලැබුවේ අභ්‍යන්තර ජලාශවල පමණි. දැනට මෙය ක්‍රම ක්‍රමයෙන් මහ මුහුද දක්වා ව්‍යාප්ත වෙමින් පවතී. 2008 වර්ෂයේ මඩකලපු දිස්ත්‍රික්කයට ඔරු 104 ක් ලබාදී ඇත. එසේම, මඩකලපු දිස්ත්‍රික්කයේ ගැඹුරු මුහුදේ මාළු ඇල්ලීම සඳහා මාළු බෝට්ටු 17 ක් ලබාදී ඇති අතර, ධීවර සමූපකාර සමිති ද පිහිටුවා ඇත. 2009 වර්ෂයේ මුළුමණින්ම ධීවර කර්මාන්තයේ නියැලීම සඳහා වූ ප්‍රඥප්තියක් මෙම සභාවට ඉදිරිපත් කරනු ලැබේ. එසේම, මඩකලපුවට ගැඹුරු මුහුදේ මාළු ඇල්ලීම සඳහා තවත් මාළු බෝට්ටු 20 ක් ලබාදීමට නියමිතව ඇත. අනෙකුත් දිස්ත්‍රික්ක දෙකටද බෝට්ටු ලබාදී ඇත.

***13.*** **සංචාරක කටයුතු**

මධ්‍යම ආණ්ඩුවේ අනුග්‍රහය ඇතිව සංචාරක කටයුතු දියුණු කිරීම සඳහා ප්‍රඥප්තියක් සකස් කරමින් පවතී. විදේශිකයින්ට ප්‍රයෝජනවත් තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයක් ද ඉදි කරනු ලැබේ. දේශීය සංචරකයින් සඳහා අඩු මිළට නිවාඩු නිකේතන ඉදිකිරීමට ද සෑම ආකාරයකින්ම දිරිමත් කිරීම් කරනු ඇත.

***14.*** **විදුලිය**

පසුගිය කාලය තුල තිබූ විදුලිබල මධ්‍යස්ථාන වසා ඇති නමුත් ප්‍රඥප්තියක් මගින් විදුලිබල මධ්‍යස්ථානයක් ඉදිකිරීමට පියවර ගනු ඇත. මධ්‍යම ආණ්ඩුවේ ශ්‍රී ලංකා විදුලිබල මධ්‍යස්ථානයෙන් විදුලිය ලබාගෙන ගම්මාන වලට ලබාදීමේ වැඩපිළිවෙලක් ද දියත් කරනු ඇත.

තවද, දර වලින් තනි ගම්මාන වලට විදුලිය ලබාදීමේ ව්‍යාපෘති සහ තනි නිවාස වලට සූර්ය ආලෝකයෙන් ලැබෙන විදුලිය ලබාදීමේ ව්‍යාපෘතියක් ද අප විසින් ක්‍රියාත්මක කිරීමට නියමිතව ඇත.

**15.** ***මාර්ග***

මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ C, D, E මාර්ග කි.මී.1110 ක් ඇත.ඒ සියල්ලක්ම අළුත්වැඩියා කිරීමත් සමඟ තාර හෝ කොන්ක්‍රීට් දැමීම එම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන වගකීම වනු ඇත. 2008 වර්ෂයේ අම්පාර දිස්ත්‍රික්කයේ කි.මී.59 ක් ද, මඩකලපුව දිස්ත්‍රික්කයේ කි.මී.6 ක් ද ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කි.මී.33 ක් ද, සංවර්ධනය කරන ලදී.

2009 වර්ෂයේ දී අම්පාර දිස්ත්‍රික්කයේ කි.මී.38 ක් ද, මඩකලපුව දිස්ත්‍රික්කයේ කි.මී.16 ක් ද ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කි.මී.22 ක් ද, සංවර්ධනය කිරීම මෙම දෙපාර්තමේන්තුව සතු වගකීම වේ.
දෙපාර්තමේන්තුවට අනුබද්ධ කර ඇති යන්ත්‍රෝපකරණ ඒකකය 2009 වර්ෂයේ දී වෙනම සංස්ථාවක් ලෙස ක්‍රියාත්මක කිරීමට ප්‍රඥප්තියක් සකස් කරමින් පවතී.

16. ***වාරිමාර්ග***

වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ ව්‍යාපෘති 41 ක්ද කුඹුරු වලට යන පාරවල් 17 ක් ද ඇත. මේ තුළින් කුරංගුපාංජාන්, මුරපොල, පුළුකුණාව යන වැව්වල දැනට ප්‍රතිසංස්කරණ කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතී.

17. ***ඉඩම්***

2008 වර්ෂයේ 'රණබිම ඉඩම්' 622 ක් ආධාර වශයෙන් ලබාදී ඇති අතර, අනවසර පදිංචි ඉඩම් 6245 ක් සඳහාද විධිවිධාන සලසා ඇත.

18. ***සමාජ සේවා***

2008 වර්ෂයේ ඔන්ඩරාච්චිමඩම්, සතුරු කොන්ඩාන්, කාත්තාන්කුඩි, සායින්දමරුදු සහ සඳුන්පුර ප්‍රදේශවල මහළු නිවාස සහ ආබාධිතයින් සඳහා වූ නිවාස ඉදි කිරීමේ වැඩ කටයුතු ආරම්භ කර ඇත. මේ සියල්ලක්ම 2009 වර්ෂය වනවිට නිමවනු ඇත. මඩකලපුවේ අළුතින් ස්ථාපිත කර ඇති " වාල්වොසයි, දරිසනම් " පාසල් ද, දෙහිඅත්තකණ්ඩිය සහ උප්පුවෙලි ප්‍රදේශයේ මහළු නිවාස ද ඉදිකිරීමට සැලසුම් කර ඇත.

**19.** ***කළමනාකරණ සංවර්ධන පුහුණු.***

2008 වර්ෂයේ පරිගණක පුහුණුවෙන් 746 දෙනෙකු ද සහ රාජ්‍ය භාෂා පුහුණුවෙන් (දෙමළ අයට සිංහල සහ සිංහල අයට දෙමළ භාෂාව) 726 දෙනෙකු ද ප්‍රයෝජනය ලබා ඇත.

2009 වර්ෂයේ පරිගණක පුහුණුවෙන් 1350 දෙනෙකුද සහ රාජ්‍ය භාෂා පුහුණුවෙන් (දෙමළ අයට සිංහල සහ සිංහල අයට දෙමළ) 800 දෙනෙකු ද ප්‍රයෝජනය ලබනු ඇත.

20. ***නිපුණතා සංවර්ධනය***

වඩු කර්මාන්තය, ත්‍රිරෝද රථ අළුත්වැඩියා, නිවෙස් වලට විදුලි රැහැන් ඇදීම වැනි ව්‍යාපෘති දැනට ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පමණක් ක්‍රියාත්මක වෙමින් පවතී. තවද කම්මල් වැඩ, ජලනල සවි කිරීම, තහඩු වැඩ, පින්තාරු කිරීම, වැනි පුහුණු වැඩසටහන් ද දියත් කිරීමට සැලසුම් කර ඇති අතර, මේ සියල්ලක්ම අනෙකුත් දිස්ත්‍රික්ක වලටද ව්‍යාප්ත කිරීමට සැලසුම් කර ඇත.

21. ***පරිසරය***

පරිසරය ආරක්‍ෂා කිරීමේ ප්‍රඥප්තියක් ද සකස් වෙමින් පවතී. එම ප්‍රඥප්තිය අනුමත කිරීමෙන් පසු පළාතේ පරිසර ආරක්‍ෂක නීතිය බලපවත්වනු ඇත.

22. ***මුද්‍රණය හා ප්‍රකාශණය***

සාමාන්‍යයෙන් අවුරුදු 20 ට පෙර, ආරම්භ කරන ලද මුද්‍රණ දෙපාර්තමේන්තුව කුඩම්මාගේ සැළකිලි ලබමින් ඇත. එය පුනරුත්ථාපනය කර, අධ්‍යාපනික පොත්පත් සහ අනෙකුත් ප්‍රකාශණ ද මුද්‍රණය කරනු ලැබේ.

23. 2008 වර්ෂයේ ආරම්භ කරන ලද ආණ්ඩුකාර කාර්යාලයේ ඉදිකිරීම් කටයුතු 2009 වර්ෂයේදී අවසන් කරනු ලැබේ. 2009 වර්ෂයේ ත්‍රිකුණාමලයේ පළාත් සභා මන්ත්‍රීවරුන් හා ප්‍රධාන ඇමැතිතුමාට නිළ නිවාස ඉදිකිරීමට කටයුතු යොදනු ලැබේ.

**ගරු සභාපතිතුමණි,**

ඉදිරි වර්ෂයේ දී,

| | | |
|---|---|---|
| ප්‍රමාණතා පාදක ප්‍රදාන | - | රු:381,503,00 |
| පළාත් විශේෂ වැඩසටහන් සඳහා වූ ප්‍රදාන | - | 1,100,142,000 |
| | | **1,481,645,000** |

මීට අමතරව අධ්‍යාපන හා සෞඛ්‍ය සේවා සඳහා විදේශීය ආධාර ද මීට ඇතුළත් වන අතර, මේ සඳහා රු:444,900,000 ක් අපේක්‍ෂා කෙරේ.

මීට අමතරව රජයේ ආදායම් දෙපාර්තමේන්තුව මගින් ද ප්‍රමාණවත් ආදායමක් සොයා ගත හැකියි යන විශ්වාසයක් මාහට ඇත.

**ගරු සභාපති තුමණි,**

අප පළාතේ කඩිනම් සංවර්ධනය, පීඩනයට පත්වූ ජනතාවට පුනරුත්ථාපන සේවා සැලසීම ආදිය මුල් කොටගෙන සකස් කර ඇති මෙම අය වැය වාර්තාව මෙම සභාව විසින් අනුමත කරනු ඇතැයි යන විශ්වාසයක් මත මෙහිදී ඉදිරිපත් කරමි.

සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන්,
ප්‍රධාන ඇමැති,